සීමාසහිත සීනෝර් පදනම - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සීමාසහිත සීනෝර් පදනමේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය පදනම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ පදනමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, පදනම ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 ඡේද අංක 54 හි දේපළ, පිරියත හා උපකරණ සහ ආයෝජන දේපළ යන අයිතම වෙන් වෙන්ව දැක්විය යුතු බව දක්වා තිබුණ ද ආයෝජන දේපළ වන මත්තුමගල ඉඩම, කරෛයිනගර් බෝට්ටු යාත්‍රාංගනය සහ මට්ටක්කුලිය බෝට්ටු යාත්‍රාංගනය දේපළ, පිරියත හා උපකරණවල වෙන් වෙන්ව දක්වා නොතිබුණි.	2025 මූල්‍ය ප්‍රකාශන තුළ වෙන්කර දැක්වීමට උපදෙස් ලබා දී ඇත.	ප්‍රමිතිය ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණ සහ ආයෝජන දේපළ යන අයිතම වෙන් වෙන්ව දැක්විය යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 07 වගන්තිය ප්‍රකාරව ආයෝජනයක් මුදල් හා මුදල් සමාන දෑ ලෙස සුදුසුකම් ලැබීමට එම ආයෝජනය පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කිරීමට හැකි විය යුතු වුවද මාස 06 ක කල්පිරීමේ කාලයක් සහිතව පවත්වාගෙන ගිය, රු.23,812,969 ක්වූ ස්ථාවර තැන්පතු වටිනාකම මුදල් හා මුදල් සමාන දෑ ලෙස දක්වා තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ 2024 දෙසැම්බර් 31 දිනට මුදල් හා සමාන දෑ එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.	ස්ථාවර තැන්පතු පොළිය ඉහළ අගයක් වනුයේ මාස 06 ක තැන්පතු සඳහා වේ. එම නිසා ආයතනයට ඉහළ මූල්‍ය ප්‍රතිපාදනයක් පවතින බැවින් එය එලෙසම පවත්වාගනු යනු ලබයි.	ප්‍රමිතිය ප්‍රකාරව මුදල් හා සමාන දෑ නිවැරදිව හඳුනාගත යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි අංක 73 ඡේදය ප්‍රකාරව දේපළ පිරියත හා උපකරණ සම්බන්ධයෙන් භාවිතා කරන ක්ෂය ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවද පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළ ක්ෂය කිරීමේ ක්‍රමවේදය හෙළිදරව් කර නොතිබුණි.	ක්ෂය ප්‍රතිපත්තිය 2025 මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කිරීමට උපදෙස් ලබා දී ඇත.	ප්‍රමිතිය ප්‍රකාරව දේපල පිරියත උපකරණ සඳහා භාවිතා කරන ක්ෂය ප්‍රතිපත්තිය හෙළිදරව් කළ යුතුය.
(ඈ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 79 (ආ) ඡේදය ප්‍රකාරව තවදුරටත් භාවිතයේ පවතින එහෙත් සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම්වල සාධාරණ වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කළ යුතු වුවද 2024 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන්ම ක්ෂය වී තිබුණු රු.111,674,701 ක්වූ වත්කම් සම්බන්ධයෙන්	වත්කම්වල සාධාරණ වටිනාකම 2025 මූල්‍ය ප්‍රකාශන තුල ප්‍රමිතියට අනුකූලව කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත.	ප්‍රමිතිය ප්‍රකාරව සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම්වලට අදාළ සාධාරණ වටිනාකම හෙළිදරව් කළ යුතුය.

	ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.		
(ඉ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 20 ප්‍රකාරව මූල්‍ය නොවන රාජ්‍ය ප්‍රදාන, වියදම් හඳුනාගන්නා කාලපරිච්ඡේද තුළ යම් ක්‍රමානුකූල පදනමක් මත ක්‍රමක්ෂය කර එම ක්‍රමක්ෂය ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දී පදනම වෙත ලබා දී තිබූ රු.22,650,000 ක් වටිනා වත්කම් එලෙස ක්‍රමක්ෂය කර නොතිබුණි.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 20 ප්‍රකාරව මූල්‍ය නොවන රාජ්‍ය ප්‍රදාන නිවැරදිව ක්ෂය කර තිබේ.	ප්‍රමිතිය ප්‍රකාරව මූල්‍ය නොවන රාජ්‍ය ප්‍රදාන ක්‍රමක්ෂය කර මූල්‍ය ප්‍රකාශ තුළ ගැලපීම් කළ යුතුය.
(ඊ)	ශ්‍රි ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 36 ප්‍රකාරව හානිකරණයට යටත් වූ වත්කම්වල ධාරණ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ හෙළිදරව් කළ යුතු වුවත් රු.1,961,850 ක්වූ ශ්‍රී බංගලාබෝට් බද්ද ව්‍යාපාරයට අදාළ හානිකරණ අලාභ සම්බන්ධයෙන් එසේ කටයුතු නොකර පිරිවැයට දක්වා තිබුණි.	ප්‍රමිති 36 ට අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හෙළිදරව් කිරීමට කටයුතු කරමි.	ප්‍රමිතිය ප්‍රකාරව හානිකරණ අලාභ ගැළපූ වත්කම්වල ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය.
(උ)	පදනමේ හිටපු සාමාන්‍යාධිකාරිවරයෙක් විසින් කම්කරු අධිකරණයේ වන්දි ඉල්ලා පැවරූ නඩුවට අදාළව රු.9,400,000 ක වන්දියක් 2025 ජූලි 17 දිනට පෙර ගෙවන ලෙස තීන්දුව ලැබී තිබුණු අතර අදාළ ඇප කොන්දේසි සපුරා නොතිබීම මත මෙතෙක් අභියාචනය ගොනු කිරීමට ද නොහැකි වී තිබුණි. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37 හි 14 ඡේදය ප්‍රකාරව ප්‍රතිපාදනයන් සිදුකර නොතිබුණි.	මෙම නඩුව නැවත මහාධිකරණයේ ගොනු කර ඇති අතර තවම නිශ්චිතව ගෙවීමට තීන්දුව ලැබී නොමැත. 2025 වර්ෂය තුළ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයක් සිදු කිරීමට කටයුතු කරමි.	ප්‍රමිතිය ප්‍රකාරව අසම්භාව්‍ය වගකීම් සම්බන්ධව ප්‍රතිපාදනයන් නිවැරදිව හඳුනාගත යුතුය.
(ඌ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 37 හි 86 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් පවරා ඇති නඩු සහ ආයතනයට එරෙහිව පවරා ඇති නඩු මූල්‍ය ප්‍රකාශනවල පැහැදිලිව හෙළිදරව් කළ යුතු වුවත් පදනම විසින් පැවරූ නඩු 02 ක් හා පදනමට එරෙහිව පැවරූ නඩු 03 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.	මෙම නඩු සියල්ල තවමත් අධිකරණයේ විභාග වෙමින් පවතින නඩු වේ. 2025 වර්ෂයේ මූල්‍ය ගිණුම් තුළ ආයතනය විසින් පවරා ඇති නඩු හා ආයතනයට එරෙහිව පවරා ඇති නඩු ශ්‍රී ලංකා ගිණුම් අංක 37 හි 86 ඡේදය ප්‍රකාරව හෙළිදරව් කිරීමට කටයුතු කරමි.	ප්‍රමිතිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශ සකස් කරන දිනට ආයතනය විසින් හා ආයතනයට එරෙහිව පවරා ඇති නඩු පිළිබඳ මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළ යුතුය.
(එ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 40 ප්‍රකාරව ආයෝජන වත්කම් අගය කර ඇත්තේ පිරිවැය ආකෘතියට ද [Cost Model] නැතහොත් සාධාරණ වටිනාකම් ආකෘතියට ද [Fair Value Model] යන්න මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.	ආයෝජන වත්කම් පිරිවැය ආකෘතිය අනුව අගය කර ඇති අතර එම ආකෘතිය 2025 මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීමට උපදෙස් ලබා දී ඇත.	ආයෝජන වත්කම් අගය කරන ලද ආකෘතිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය.
(ඒ)	ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 15 හි 31ට පටහැනිව 2024 දෙසැම්බර් 31 දින වන විට	සියලුම නිෂ්පාදිත කටයුතු අවසන් කර ඇණවුම් කළ ආයතන වෙත	මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත ප්‍රකාරව අදාළ

පාරිභෝගිකයාට භාර දී නොතිබුණු එකතුව රු.54,893,100 ක්වූ 2024 වර්ෂයේ විකුණුම් ඉන්වොයිස් 23 කට අදාල භාණ්ඩ සඳහා ලද මුදල් අත්තිකාරමක් ලෙස හා වගකීමක් ලෙස ගිණුම් ගත කල යුතු වුවද 2024 වර්ෂයේ විකුණුම් ලෙස ගිණුම්ගත කර තිබුණි.	ලබා ගැනීමට සැලැස්වූ අතර එම ආයතන විසින් ඒවා රැගෙන යාමට ප්‍රමාද වී ඇත. ඇණවුම් බෙදාහැරීම් කිරීමේ දී බෙදාහැරීමේ තදබදයක් පවතින අතර. ඇතැම් භාණ්ඩ පාරිභෝගියන්ට ලබා දී තිබේ.	විකුණුම් ආදායම නිවැරදිව හඳුනාගත යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	බැංකු සුරකුම් උපලේඛනය අනුව 2017 වර්ෂයේ දී කල්ඉකුත් වූ රු.1,383,911 ක්වූ බැංකු සුරකුම් දිගින් දිගටම ජංගම වත්කම් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර කාලය දීර්ඝ කිරීමට හෝ මුදල් බවට පත්කර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.	බැංකු සුරැකුම්පත් සියල්ල විගණනයට ඉදිරිපත් කර ඇත. පැරණි ශේෂයන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර ඉවත් කිරීමට උපදෙස් ලබා දී ඇත.	කල්ඉකුත් වූ බැංකු සුරැකුම් වටිනාකම් නිවැරදි ගිණුම්වල ගැලපිය යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ සේවක පාරිතෝෂික සඳහා ප්‍රතිපාදනය රු.4,095,417 ක් වූ අතර එය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ බදු පෙර ශුද්ධ ලාභයට එකතු විය යුතු නමුත් අඩුකර දක්වා තිබුණි. 2024 වර්ෂයට අදාළව නිලධාරීන් දෙදෙනකු සඳහා පාරිතෝෂික ගෙවීම් රු.578,642 ක් ගෙවා තිබූ නමුත්, පාරිතෝෂික ගෙවීම් ලෙස රු.7,612,193 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ එකතුකොට දක්වා තිබුණි.	මූල්‍ය ප්‍රකාශනයේ සටහන් 19 නිවැරදි විය යුතුය. මෙය අංකමය වෙනස නිසා සිදුවූවක් වන අතර ලාභ අලාභයට හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයට කිසිදු වෙනසක් සිදු නොවේ.	සේවක පාරිතෝෂික ප්‍රතිපාදන කිරීම් සහ මුදලින් ගෙවීම් නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගැලපිය යුතුය.
(ඇ)	අලෙවියෙන් පසු සේවා සහ මත්ස්‍ය ඒකරාශීකරණ ඇටවුම් (FAD Buoy) ප්‍රතිපාදන වෙන්කිරීම් සඳහා එකතුව රු.20,411,373 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ බදු පෙර ශුද්ධ ලාභයට ගැලපීම් කර නොතිබීම හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. තවද පෙර වර්ෂවල රු.12,479,701 ක්වූ වැරදි නිවැරදි කිරීම් මුදල් ප්‍රවාහයට ගැලපීම් කළ නොහැකි වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ බදු පෙර ශුද්ධ ලාභයෙන් අඩුකර දක්වා තිබීම නිසා කාරක ප්‍රාග්ධන ගැලපීම්වලට පෙර මෙහෙයුම් ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.	අලෙවියෙන් පසු සේවා ප්‍රතිපාදන හා ඇටවුම් (FAD) බෝයා ප්‍රතිපාදන මුදල් ප්‍රකාශයේ බදු පෙර ශුද්ධ ලාභයට ගැලපීම් කිරීමට උපදෙස් ලබා දුනි. පූර්ව වර්ෂවල නිවැරදි කිරීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට නොගැලපීමට උපදෙස් ලබා දුනි.	අලෙවියෙන් පසු ප්‍රතිපාදන වෙන්කිරීම් නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගැලපිය යුතුය. ඉකුත් වර්ෂවලට අදාළ ගැලපීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට නොගැලපිය යුතුය.

(ඈ)	සමාලෝචිත වර්ෂයට අදාළ බදුකුලී ආදායම රු.24,511,291 ක් බදු පෙර ශුද්ධ ලාභයෙන් අඩුකර දැක්විය යුතු වුවද එසේ ගලපා නොමැති බැවින් කාරක ප්‍රාග්ධන ගැලපීම්වලට පෙර මෙහෙයුම් ලාභය රු.24,511,291 ක් වැඩියෙන් දැක්වුණි. තවද වර්ෂයේ බදුකුලී ආදායම ලෙස මුදලින් ලැබුණු මුදල රු.23,266,774 ක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ රු.24,511,291 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ජනනය වු මුදල් ප්‍රවාහය රු. 1,244,517 ක් වැඩියෙන් දැක්වුණි.	වර්ෂයේ බදු කුලී ආදායම නිවැරදිව ගලපා බදු කුලිය වශයෙන් ලද සත්‍ය මුදල 2025 මූල්‍ය ප්‍රකාශවල නිවැරදි කිරීමට උපදෙස් දෙන ලදී.	වර්ෂයට අදාළ බදු කුලී ආදායම හා මුදලින් ලද බදු කුලී ආදායම නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ ගැලපිය යුතුය.
(ඉ)	පදනම විසින් තොග, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගය මත ගිණුම් තැබීම සිදුකරන බවට සටහන් 2.2.1 යටතේ හෙළිදරව් කර තිබුණ ද 2024 දෙසැම්බර් 31 දිනට වෙළඳ තොගය තුළ ඇතුළත් යාත්‍රා දෙකක වෙළඳපල වටිනාකම හා පිරිවැයෙහි එකතුව වන රු.642,161 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබීම හේතුවෙන් පදනමේ සමාලෝචිත වර්ෂයේ ලාභය රු.450,000 ක් වැඩියෙන් දැක්වුණි.	2025 වර්ෂය තුල ප්‍රත්‍යාගණනය සඳහා නිවරදි කිරීමට උපදෙස් ලබා දුනි.	තොගය ප්‍රමිතිය ප්‍රකාරව පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකින් අඩු අගය මත හඳුනාගත යුතුය.
(ඊ)	හඳුනා නොගත් ලැබීම් පසුව එළඹෙන මාසයේ දී හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වුවද රාජ්‍ය බැංකු ජංගම ගිණුමකට අදාළ 2024 දෙසැම්බර් මාසයේ බැංකු සැසඳුම් ප්‍රකාශනය අනුව එකතුව රු.3,659,354 ක්වූ 2018 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා හඳුනා නොගත් ලැබීම් පැවති අතර විගණිත දිනය වූ 2025 නොවැම්බර් 07 දින වන විටත් නිරවුල් කර ගිණුම් තැබීමට කටයුතු කර නොතිබුණි.	2018 සිට 2024 දක්වා හඳුනා නොගත් ලැබීම් ලෙස පෙන්වනු ලබන තැන්පතු කිසිදු අනන්‍යතාවයක් තහවුරු නොකර අප ගිණුමට සෘජුවම තැන්පත් කල මුදල් වේ. අප ආයතනයේ ආදායමක් ලෙස හෝ ලැබීමක් ලෙස හඳුනාගැනීමට කිසිදු සාක්ෂියක් නොමැති බැවින් මෙම ලැබීම් තවදුරටත් බැංකු සැසඳුම් තුළ දක්වා ඇත.	සියලු ලැබීම් නිවැරදිව හඳුනාගත හැකි වන පරිදි ලැබීම් ක්‍රමවේදය හඳුන්වා දියයුතුය.

1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

	විෂයය	මුදල	නොසැපයූ විගණන සාක්ෂි	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
		රු.			
(අ)	අනෙකුත් ලැබිය යුතු දෑ	206,703	තහවුරු කරගැනීමේ ලේඛන, ශේෂ සනාථන	මෙම ශේෂය 2010.07.07 වන දින ඉන්වොයිස් අංක 12922 යටතේ 102863 හා 2010.11.10 වන දින ඉංවොයිස් අංක 13230 යටතේ 103824	අවශ්‍ය ලේඛන හා ශේෂ සනාථන විගණනයට ඉදිරිපත් කළ යුතුය.

				ලෙස ගිණුම්කරණ පද්ධතිය තුල පෙන්වනු ලබයි. වෙන් කිරීමක් කිරීමට උපදෙස් ලබා දී ඇත.	
(ආ)	රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන හා පුද්ගල ණයගැති ශේෂ	85,024,104	ශේෂය තහවුරු කරගැනීමේ ලේඛන, ශේෂ සනාථන	2025 වර්ෂයේ ණය ගැති ශේෂ ලබාගෙන නිරවද්‍යතාවය තහවුරු කර අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර වෙන් කිරීමක් කිරීමට කටයුතු කරමි.	එම
(ඇ)	ද්‍රව්‍ය අත්තිකාරම් හා අනෙකුත් ලැබිය යුතු දෑ	1,990,047	තහවුරු කරගැනීමේ ලේඛන, ශේෂ සනාථන	මෙම ශේෂය වසර 15 ක් පැරණිය. අධ්‍යක්ෂක මණ්ඩලයට යොමු කර වෙන් කිරීමක් කිරීමට උපදෙස් ලබා දී ඇත.	අවශ්‍ය ලේඛන සහ ශේෂ සනාථන විගණනයට ඉදිරිපත් කළ යුතුය.
(ඈ)	විවිධ ආයතනවල තැන්පත් කර ඇති නැවත ලැබිය යුතු තැන්පතු ශේෂය	616,133	තහවුරු කරගැනීමේ මූලාශ්‍ර ලේඛන	විදුලිබල මණ්ඩලය සඳහා රු.281,612ක් නැවත ගෙවන තැන්පතු ලෙස තබා ඇත. NAQDA ආයතනයෙන් රු.200,000ක මුදලක් 68215 වවුචරයේ අමුණා ඇත.	ලැබිය යුතු පැරණි ශේෂ පදනම වෙත නැවත අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට රු.85,024,104 ක්වූ ණයගැති ශේෂය තුළ 2002 සිට 2017 දක්වා කාලපරාසයක සිට පැවතෙන රු.30,049,547 ක්වූ ණයගැති ශේෂයක් පැවතුණු අතර එය මුළු ණයගැති ශේෂයෙන් සියයට 35 ක් විය. එම ණයගැති ශේෂ අතරින් බාහිර ණයගැතියන්ට අමතරව රු.7,816,786 ක්වූ රාජ්‍ය ආයතනවල ණය ද ඇතුළත්ව තිබුණු අතර එම ණය නැවත අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	අලෙවි අංශය විසින් ණයගැති ශේෂ අයත් ආයතනවලින් අය කර ගැනීමට කටයුතු කර ඇති අතර එය ව්‍යවර්ථ වී ඇත. සමහර ශේෂයන් වසර 15 කට වඩා පැරණි ශේෂයන් බැවින් ඒ පිළිබඳව එම ආයතනවල අදාල ලේඛන ද නොමැත. නැවත එම ශේෂ පිළිබඳව පූර්ණ අවධානය යොමු කර අයකර ගැනීමට උපදෙස් ලබා දී ඇත.	ණයශේෂ කාලීනව අයකර ගැනීමට හා හිඟ ණයගැති ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	උපකොන්ත්‍රාත් පදනම යටතේ මාළු දැල් නිපදවීමට පුද්ගලික ආයතනයකට රු.5,059,049 ක් වටිනා මාළු දැල් නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා දී තිබුණු අතර, එයින් රු.149,274 ක් වටිනා මාළු දැල් පමණක් පදනම වෙත ලැබී තිබුණි. ඉතිරි අමුද්‍රව්‍ය වටිනාකම වූ රු.4,909,775 ක් 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂයේ ද එම ශේෂ අයකර	ශේෂ සනාථ කිරීමේ ලිපි ලියාපදිංචි තැපෑලෙන් යැවුව ද කිසිදු ප්‍රතිචාරයක් නොමැත. 2025 වර්ෂය තුල වෙන් කිරීමක් කිරීමට උපදෙස් ලබා දී ඇත.	හිඟහිටි ණය ශේෂයන් අයකර ගැනීමට විධිමත් ක්‍රමවේදයන් සකස් කළ යුතුය.

	ගැනීමට හෝ එම ආයතනයට විරුද්ධව නෛතික ක්‍රියාමාර්ග හෝ ගෙන නොතිබුණි.		
(ඇ)	මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ 2024 දෙසැම්බර් 31 දිනට අනෙකුත් අත්තිකාරම් ලෙස දක්වා තිබුණු රු.29,088,096 ක ශේෂය 2013 වර්ෂයේ සිට පැවත එන අතර එම ශේෂය විගණිත දිනය වන විටත් නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	පැරණි ශේෂයන් සඳහා වෙන් කිරීමක් කිරීමට උපදෙස් ලබා දී ඇත.	අත්තිකාරම් නැවත අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඈ)	ධීවර අමාත්‍යාංශය යටතේ ඉදිකිරීම් කටයුතු සිදුකරනු ලැබූ දික්ඕවිට ධීවර වරාය ව්‍යාපෘතියට අදාළ විශේෂිත ඉදිකිරීම් කාර්යයන් පදනම හරහා සිදුකරගෙන තිබුණු අතර, ඒ වෙනුවෙන් ධීවර අමාත්‍යාංශය වෙතින් ගොඩනැගිලි පරිශ්‍රය වෙනුවෙන් රු.1,770,766 ක් හා භූමි පරිශ්‍රය වෙනුවෙන් රු.1,757,057 ක් වශයෙන් එකතුව රු.3,527,823 ක් අයවිය යුතුව පැවතුණි. මෙම ශේෂයන් 2012 සිට 2017 වර්ෂය දක්වා කාලයට අදාළව පැවති අතර එම ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.	දික්ඕවිට ධීවර වරායේ රුඳවුම් ගාස්තු ලෙස ඇති මෙම ශේෂය නිදහස් කරන ලෙස කිහිපවතාවක ඉල්ලීම් කල ද 2025 වර්ෂයේ දී එවැනි මුදලක් ලබා දීමට නොමැති බව තහවුරු කර ලිපියක් ධීවර අමාත්‍යාංශයෙන් අප වෙත ලබා දී ඇත. එය අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර වෙන් කිරීමක් කිරීමට උපදෙස් ලබා දෙන ලදී.	තහවුරු ලේඛණ ඉදිරිපත් කර ලැබියයුතු ශේෂ අයකර ගැනීමට හෝ ලැබීම් අවිනිශ්චිත නම් අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය.
(ඉ)	පදනමේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව නෝර්ත් සී ලිමිටඩ් වෙතින් රු.9,204,498 ක්වූ ලැබිය යුතු ශේෂයක් දක්වා තිබුණ ද නෝර්ත් සී ලිමිටඩ් වෙතින් ලබාගත් ඍජු ශේෂ සනාථනය අනුව සී-නෝර් පදනමෙන් 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ලෙස රු.2,262,237 ක ශේෂයක් දක්වා තිබුණ ද එම ශේෂයන් සසඳා නිරවුල් කරගැනීමට කටයුතු කර නොතිබුණි.	මෙම නෝර්ත් සී ආයතනයේ ශේෂය වසර 12 කට පැරණි ශේෂයක් වන අතර සාකච්ඡා වට කිහිපයක් පැවැත්වුව ද මෙම ශේෂයන් පිළිබඳ අවසන් නිගමනයන්ට එළඹීමට නොහැකි විය. එම නිසා ඉදිරියේ දී වෙන්කිරීමක් කිරීමට කටයුතු කරමින් පවතී.	ශේෂයන් සසඳා කඩිනමින් නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුය.

1.6.2 ගෙවිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වර්ෂ 05ත් 14ත් කාල පරාසයක සිට පැවත එන රු. 1,348,430 ක්වූ වෙළඳ ණයහිමියන් 2024 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.	2025 වර්ෂය තුළ ශේෂ සනාථ ලිපි ලබාගෙන නිවැරදිතාවය තහවුරු කර වෙන් කිරීමක් කිරීමට උපදෙස් ලබා දී ඇත.	පැරණි ණය හිමි ශේෂ නිරවුල් කිරීමට හෝ ගෙවීම් අවිනිශ්චිත නම් ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	අනෙකුත් ගෙවිය යුතු දෑ තුළ ඇතුළත් රු. 60,573,464 ක්වූ නැවත ගෙවිය යුතු තැන්පතු ශේෂයන්ගෙන් වර්ෂ 5 කට වඩා වැඩි කාලයක් ඉක්ම වූ රු.38,634,259 ක තැන්පතු ශේෂ පැවතුණු අතර එම ශේෂයන් පිළිබඳ සොයා	වර්ෂ 05 කට වඩා පැරණි ශේෂයන් සඳහා ඉල්ලීම් කර නොමැති අතර, තැන්පතු ශේෂ සඳහා ඉල්ලීම මත	අනෙකුත් තැන්පතු ශේෂ පිළිබඳ සොයා බලා නිරවුල්

	බලා නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය තුළ දී ද කටයුතු කර නොතිබුණි.	පමණක් ගෙවීම් කරනු ලබයි.	කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	අනෙකුත් ගෙවිය යුතු දෑ තුළ ඇතුළත් 2016 වර්ෂයේ සිට නිලධාරීන් දෙදෙනෙකු වෙත ගෙවිය යුතු වූ රු.412,620 ක්වූ නොගෙවූ පාරිතෝෂික (Unclaimed Gratuity) ගිණුමේ ශේෂය හා රු.3,210,163 ක ගෙවිය යුතු රඳවාගැනීම් (Retention Payable) ශේෂය තුළ වර්ෂ 13 ට වැඩි කාලයක සිට පැවත එන ආයතන හා පුද්ගලයන් 18 කට ගෙවිය යුතු එකතුව රු.2,938,166 ක ශේෂයක් හා වර්ෂ 5 ත් 7 ත් අතර කාලයක සිට පැවත එන රු. 117,701 ක ශේෂයක් පැවතුණු අතර එම කල්ගතවූ ශේෂයන් පිළිබඳව සොයාබලා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	කාර්යය නිම වුව ද මෙම මුදල් නිදහස් කරන ලෙස ඉල්ලීම් ලැබී නොමැත. මෙම ශේෂය අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර ආදායමක් සේ හඳුනා ගැනීමට උපදෙස් දෙන ලදී.	පැරණි රඳවාගැනීම් ශේෂ දීර්ඝ කාලීනව පැවතීම හේතු සොයා බලා එය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	අනෙකුත් ගෙවිය යුතු දෑ තුළ ඇතුළත් රු. 485,333 ක් වූ නොගෙවූ වැටුප් (Unclaimed Salaries & wages) ශේෂය තුළ වර්ෂ 10 කට වැඩි කාලයක් නිරවුල් නොකරන ලද රු. 153,009 ක් වූ නොගෙවූ වැටුප් ශේෂය හා වර්ෂ 5 කට වැඩි කාලයක් නිරවුල් නොකරන ලද රු. 178,145 ක් වූ නොගෙවූ වැටුප් ශේෂය සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	මෙම ශේෂයන් සේවයෙන් ඉවත්ව ගිය අයගේ ශේෂයන් වන අතර නොගෙවූ වැටුප්වලට අදාලව කිසිදු සේවකයෙක් ඉල්ලීම් කර නොමැත. මෙම ශේෂයන් අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර ආදායමක් සේ හඳුනා ගැනීමට උපදෙස් දෙන ලදී.	පැරණි ශේෂ පිළිබඳ සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2021 නොවැම්බර් 16 දිනැති 01/2021 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙන් සමඟ ඉදිරිපත් කර තිබූ මෙහෙයුම් අත්පොත			
(i)	6.3 වගන්තිය	සමාගම් පනත යටතේ සංස්ථාපිත කළ රාජ්‍ය සමාගම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත ණය ලබාගත යුතු වුවද 2024 දෙසැම්බර් 31 දිනට රු.27,278,779 ක්වූ බැංකු අයිරා ශේෂය සම්බන්ධයෙන් ලබාගත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	මෙම ආයතනය සංස්ථාපනය කර මූලික අවධියේ ලබාගත් අයිරා ශේෂයක් වේ.	බැංකු අයිරා ශේෂය සඳහා ලබාගත් විධිමත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය.

(ii)	6.6 වගන්තිය	මූල්‍ය වර්ෂය අවසන් වී මාස 05 ක් ඇතුළත වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද සීමාසහිත සී-නෝර් පදනම විසින් 2023 වර්ෂය වෙනුවෙන් වූ වාර්ෂික වාර්තාව මෙම වාර්තාවේ දිනවන විටත් සභාගත කර නොතිබුණි.	2020 දක්වා වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුව වෙත සභාගත කර ඇත. 2021,2022 මුද්‍රණය කර අවසන්ව ඇත. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී. 2023,2024 කෙටුම්පත් කිරීම අවසන්ව ඇත. මුද්‍රණය කිරීම සඳහා කටයුතු කරමින් පවතී.	සෑම මූල්‍ය වර්ෂයක් අවසාන වී මාස 05 ක් ඇතුළත වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය.
(iii)	6.7 වගන්තිය	ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් සිදුකළ වාර්ෂික සමීක්ෂණ වාර්තා විගණිත දිනය වන 2025 නොවැම්බර් 07 දිනවන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	ස්ථාවර වත්කම් ආගණනයක් මෙම වසර තුල කිරීමට කටයුතු කරමින් පවතී.	භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය.
(ආ)	2021 නොවැම්බර් 16 දිනැති 01/2021 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමඟ ඉදිරිපත් කර තිබුණු රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මාර්ගෝපදේශයේ 4.4 මාර්ගෝපදේශය	සියලුම රාජ්‍ය ව්‍යවසායන් අභ්‍යන්තර විගණකයෙකු පත්කර තිබිය යුතු වුවද පදනමේ අභ්‍යන්තර විගණක තනතුර විගණිත දිනය වූ 2025 නොවැම්බර් 07 දින වන විට වසරකට වැඩි කාලයක සිට පුරප්පාඩු වී තිබුණි.	2024 සැප්තැම්බර් මාසයෙන් පසුව අභ්‍යන්තර විගණක සේවයෙන් ඉල්ලා අස් වූ අතර විගණක සහකාර වශයෙන් සේවය කල නිලධාරිනිය ද එම වසරේම දෙසැම්බර් මස විදේශ රැකියාවක් සඳහා පිටත්ව ගොස් ඇත. අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගැනීම සඳහා අවශ්‍ය අනුමැතීන් සඳහා යොමු කල ද මේ වන තෙක් අනුමැතිය ලැබී නොමැත.	අභ්‍යන්තර විගණක තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා කඩිනමින් කටයුතු කළ යුතුය.
(ඇ)	සාංගමික සංස්ථා පත්‍රය 3.3 හා 3.5 ඡේද	පදනම පිහිටුවීමේ පරමාර්ථ වන අයිස් නිෂ්පාදනය, සාගර නිෂ්පාදන පැකට් කිරීම, විකුණුම්කරණය සහ අපනයනය, මසුන් දැල් නිෂ්පාදනය කිරීම සහ බෝට්ටු නිෂ්පාදනය හා බෙදාහැරීම යන කටයුතුවලට පටහැනිව බෝට්ටු නිෂ්පාදනය ලොතරැයි කුඩු, බීජ නිෂ්පාදනය කිරීමේ පොලිතීන් ගෘහ ඉදිකිරීම ආදි කටයුතු සිදුකර තිබුණි.	සාංගමික සංස්ථා පත්‍රයේ අප ආයතනයට ආවේණික නිෂ්පාදන කටයුතු අප විසින් සිදු කරන අතර ආයතනයේ පැවැත්ම සඳහා මුදල් ප්‍රවාහයන් නිසි පරිදි පවත්වාගෙන යාම සඳහා විවිධ ව්‍යාපෘති ඇණවුම් කිරීමට සිදු වී ඇත.	සාංගමික සංස්ථා පත්‍රයේ දැක්වෙන පරමාර්ථ ඉටු කර ගැනිමට කටයුතු කළ යුතුය.

(ඈ)	සාංගමික ව්‍යවස්ථාවලියේ 53 ඡේදය	2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා මහා සභා රැස්වීම් පවත්වා නොතිබුණි.	ඉතා ඉක්මණින් වාර්ෂික මහසභා රැස්වීම පැවැත්වීමට කටයුතු කරමින් පවතී.	සෑම වර්ෂයකම වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්විය යුතුය.
(ඉ)	සාංගමික ව්‍යවස්ථාවලියේ 58 ඡේදය	වාර්ෂික මහා සභා රැස්වීමේ දී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විසින් පදනමේ සභාපතිවරයා පත්කළ යුතු වුවත් එලෙස පත්කර නොතිබුණි.	ඉතා ඉක්මණින් වාර්ෂික මහසභා රැස්වීම පැවැත්වීමට කටයුතු කරමින් පවතී.	වාර්ෂික මහා සභා රැස්වීමේ දී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විසින් පදනමේ සභාපතිවරයා පත්කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.6,124,428 ක අතිරික්කයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.3,482,963ක අතිරික්තයක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,641,465ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව වෙනත් මෙහෙයුම් ආදායම් සියයට 115 කින් එනම් රු.48,447,015 කින් ඉහළ යාම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 හා 2024 යන වර්ෂ සඳහා ආයතනය විසින් සකස් කළ ක්‍රියාකාරි සැලසුම් සංයුක්ත සැලසුමට ඇතුලත් කරන ලද උපායමාර්ග අනුව සකස් කර නොතිබුණු අතර 2023 – 2027 කාලයට අදාළ සංයුක්ත සැලැස්ම සකස් කර විගණිත දිනය වූ 2025 නොවැම්බර් 07 දින වන විට වසර දෙකක් ඉක්මවා ගොස් තිබුණ ද එහි ඉලක්ක ළඟා කරගැනීම සඳහා කටයුතු ආරම්භ කර නොතිබුණි. එබැවින් එම සංයුක්ත සැලැස්ම හුදෙක් ප්‍රායෝගිකව ක්‍රියාත්මක නොකරන ලියවිල්ලක් පමණක් බවට පත්වී තිබුණි.	සංයුක්ත සැලැස්ම අනුව සියයට 100 ක් අරමුණු කරා ලඟා වීමට නොහැකි අතර මූලාරම්භයක් ලෙස එම කටයුතු ආරම්භ කර පැවතුණි.	සංයුක්ත සැලැස්මට අනුකූල වන පරිදි වාර්ෂික ක්‍රියාකාරි සැලැසුම් සකස් කළ යුතුය.
(ආ)	2024 වර්ෂයේ අනුමත ක්‍රියාකාරි සැලැස්මට අනුව ඇස්තමේන්තුගත මුළු විකුණුම් ආදායම රු.341,870,357 ක්වූ අතර එහි ඇතුළත් ක්‍රියාකාරකම් අතරින් ක්‍රියාකාරකම් 14 ට අදාළව ප්‍රගතිය සියයට 0 ක් විය. එම ක්‍රියාකාරකම්වලට අදාළව ලභාකර නොගත් ඇස්තමේන්තුගත මුළු විකුණුම් ආදායමට රු.245,919,130 ක් හෙවත් ඇස්තමේන්තුගත මුළු විකුණුම් ආදායමින් සියයට 71.9 ක් විය.	අප ක්‍රියාකාරී සැලැස්ම යාත්‍රාංගනයේ ධාරිතාව පදනම්ව නිර්මාණය කරන අතර ඇණවුම් ලැබීමේ දී අප විසින් ක්‍රියාකාරී සැලසුමට ඇතුලත් කරනු ලබන සියලූ ඇස්තමේන්තුගත ආදායම් නොලැබේ. නමුත් අප විසින් ඇස්තමේන්තුගත විකුණුම් හා සමානව ඇණවුම් වෙනත් ආදායම් ප්‍රභවයන්ගෙන් ලබා ගනී.	ළඟා කරගත හැකි පරිදි නිවැරදිව ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කළ යුතුය.

(ඇ)	ක්‍රියාකාරි සැලැස්මෙහි ප්‍රගතිය අනුව ක්‍රියාකාරකම් 8 ක භෞතික ප්‍රගතිය සියයට 33 කටත් වඩා අඩු මට්ටමක පැවති අතර එම ක්‍රියාකාරකම්වලට අදාළව ලඟාකර නොගත් ඇස්තමේන්තුගත මුළු විකුණුම් ආදායම රු.43,905,969 ක් හෙවත් සියයට 12.8 ක් විය.	ක්‍රියාකාරී සැලැස්ම පරිදි ඇස්තමේන්තු කළ ද එම ඇණවුම් කළ ප්‍රමාණවලින්ම ලබා ගැනීමට නොහැකි වේ. ඒවා අඩු වැඩි වශයෙන් ලැබේ. එම ඇස්තමේන්තුගත මුළු ආදායම අඩු වුව ද වෙනත් ෆයිබර් අයිතමයන්ගෙන් විකුණුම් ආදායම වැඩි කර ගනිමින් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම තහවුරු කර ගැනීමට සිදු වේ. 2026 වර්ෂය තුල ක්‍රියාකාරී සැලැස්ම යථාර්ථවාදීව සකස් කිරීමට හා ඇස්තමේන්තුගත ආදායම ලබා කර ගැනීමට උපදෙස් ලබා දී ඇත.	ළඟා කරගත හැකි ඉලක්ක හඳුනාගෙන නිවැරදිව සැලසුම් සකස් කළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය තුළදී ආයතනය විසින් රජයේ බැංකුවක පවත්වාගෙන යනු ලැබූ ගිණුමට අදාළව අයිරා පොලිය ලෙස රු.3,728,046 ක් ගෙවා තිබූ අතර එය ආයතනයේ මුළු වියදමින් සියයට 5.4 ක් ගෙන තිබුණි.	සමාලෝචිත වර්ෂයේ බැංකු අයිරා පොලිය ඉතා ඉහළ අගයක් ගෙන තිබුණි. සියලුම මෙහෙයුම් කටයුතු බැංකු අයිරා ගිණුම මගින් කරගෙන යනු ලබන අතර එම නිසා අයිරා පොලිය වශයෙන් විශාල මුදලක් ගෙවීමට සිදු වේ.	අයිරාව අවම වන පරිදි මූල්‍ය කළමනාකරණය සිදුකළ යුතුය.
(ආ)	පදනම විසින් පෞද්ගලික ආයතනයකට උපකොන්ත්‍රාත් පදනම මත ලබා දී තිබුණු යාත්‍රා දෙකක් ඇණවුම් සඳහා රු.31,931,782 ක් 2017 වර්ෂයේ දී ගෙවා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයේ දී ද එම යාත්‍රා දෙකෙහි වැඩ නිමකර ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවට ලබාදීමට කටයුතු කර නොතිබුණි.	මෙහි අධීක්ෂණ කටයුතු අප වෙත පැවරී ඇති අතර අප විසින් මෙය ඉතා ඉක්මණින් නිමකර ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව වෙත පත් කරන ලෙස අවවාද කර හා උපදෙස් ලබා දී තිබුණි. මේ වන විට එක් යාත්‍රාවක නිෂ්පාදන කටයුතු අවසන් කර ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත.	ඉතිරි යාත්‍රාව ද ඉදිකිරීම් අවසන් කර භාරදීමට කටයුතු කළ යුතුය.
(ඇ)	කරෛයිනගර් බෝට්ටු යාත්‍රාංගනය සූර්ය පැනල බෝට්ටු පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා පෞද්ගලික ආයතනයක් වෙත 2023 මැයි 10 වන දින සිට මාස 06 ක කාලයකට රු.300,000 ක මාසික බදු මුදලකට ලබා දී තිබුණි. එම ආයතනයෙන් රු.699,625 ක හිඟහිටි බදු මුදල අයකර ගැනීමට විගණිත දින හෙවත් 2025 නොවැම්බර් 07 දින තෙක් කටයුතු කර නොතිබුණු අතර 2023 නොවැම්බර් මස 09 දින ගිවිසුම අවසන්ව පැවතුණි.	කරෛයිනගර් බෝට්ටු යාත්‍රාංගනය බදු පදනම මත ලබා දී තිබූ ආයතනයේ හිඟ මුදල වන රු. 699,625 ක මුදල අය කර ගැනීමට කටයුතු කරමින් පවතී.	හිඟ මුදල් කඩිනමින් අයකර ගත යුතුය.

(ඇ)	පදනම විසින් යාපනයට යැවීම සඳහා නිමකළ වටිනාකම රු.3,365,896 ක් වූ 24 Feet Ambulance යාත්‍රාව ගැණුම්කරු විසින් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් 2020 වර්ෂයේ සිටම මට්ටක්කුලිය බෝට්ටු අංගනය තුළ රඳවා තබා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දී ද එය භාරදීම සඳහා හෝ වෙනත් පාර්ශවයකට විකිණීමට හෝ උක්ත ගැණුම්කරුට විරුද්ධව නෛතික ක්‍රියාමාර්ග හෝ ගෙන නොමැත.	24 Feet Ambulance යාත්‍රාව නැවත අලෙවිය සඳහා කටයුතු කරමින් පවතී.	නැවත අලෙවි කිරීමට හා ගැණුම්කරුට විරුද්ධව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.
(ඉ)	කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන) තනතුරු 02 ක් සඳහා ලැබී තිබුණු අයදුම්පත් අතරින් සුදුසුකම් ලත් අයදුම්කරුවන් 50 දෙනෙකු සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවා තිබුණි. සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් 23 දෙනෙකු සහභාගී වී තිබුණු අතර ලබාගත් ලකුණු අනුව ඉහළම සම ලකුණු ලබාගත් අයදුම්කරුවන් දෙදෙනෙකු සිටිය දී ඉන් එක් අයකු පමණක් එක් තනතුරක් සඳහා තෝරාගෙන තිබුණි. අනෙක් තනතුර සඳහා ඉහළ ලකුණු ලබාගත් අයදුම්කරුවන් සිටිය දී ලකුණු අනුපිළිවෙල අනුව 16 වැන්නා තෝරාගෙන තිබුණි.	2012.07.13 වන දින අනුමත කරගන්නා ලද බඳවාගැනීමේ කාර්ය පරිපාටියට අනුව කළමනාකරණ සහකාර තනතුර සඳහා බඳවාගැනීමේ කාර්ය පරිපාටියට අනුව නව බඳවා ගැනීමක් සිදුවන අවස්ථාවේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් බඳවාගැනීමට අපේක්ෂා කරන තනතුරු සඳහා අනුමැතිය ලබා ගත යුතුය. එම අනුමැතියෙන් ලබාගත් පසු පුවත් පත් දැන්වීම් පළ කිරීම සිදුකළ යුතුය. ආයතනයේ අවශ්‍යතාවය මත මෙම සියළුම බඳවා ගැනීම් එවකට සිටි සභාපතිතුමාගේ සහ අධ්‍යක්ෂක මණ්ඩලයේ උපදෙස් හා අනුමැතියෙන් කළමණාකරණ සහකාර තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කර ඇත.	බඳවාගැනීම් සෑමවිටම විනිවිධභාවයෙන් යුතුව, බඳවා ගැනීම් පටිපාටිය අනුව සිදුකළ යුතුය.
(ඊ)	"කළමනාකරණ" සේවා ගණයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටියේ 5.4 ඡේදය ප්‍රකාරව "සේවා ගණයේ II ශ්‍රේණියට අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේ සුදුසුකම්" යටතේ අභ්‍යන්තර අයදුම්කරුවන් කණිෂ්ඨ කළමනාකරණ සේවා ගණයේ අදාළ ක්ෂේත්‍රයේ පළමු ශ්‍රේණියේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු බව දක්වා තිබුණ ද, තොරතුරු තාක්ෂණ කළමනාකරණ (II ශ්‍රේණිය) තනතුරට උසස් කර තිබුණු නිලධාරිනිය කණිෂ්ඨ කළමනාකරණ සේවා ගණයේ අදාළ ක්ෂේත්‍රයේ පළමු ශ්‍රේණියේ තනතුරේ වසරකුත් මාසයක් පමණක් හා උක්ත තොරතුරු තාක්ෂණ කළමනාකාර තනතුරේ මාස 07 ක කාලයක් වැඩබලන රාජකාරි පමණක් ඉටුකර තිබුණි.	මෙම තනතුර සඳහා නියමිත ක්‍රමවේදයට අනුව බඳවාගැනීම සිදු වී නොමැති බවත් බඳවාගැනීම් කාර්ය පරිපාටිය අනුව නව බඳවාගැනීමක් සිදුකරන්නේ නම් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගත යුතුව ඇත. MM1-1 ශ්‍රේණියේ සඳහා බඳවාගැනීමේ දී තිබිය යුතු අවම සුදුසුකම් අදාල ක්ෂේත්‍රයට අදාල උපාධිය ලබා ගැනීමත් වසර 03 ක පලපුරුද්දක් අයදුම්කරුවන් විසින් සපුරා තිබිය යුතුය. නමුත් එම සුදුසුකම සපුරා නොතිබිණි. බඳවාගැනීමේ කාර්ය පරිපාටියට අනුව අභ්‍යන්තර උසස්වීමක් ලබා දෙන්නේ නම් කණිෂ්ඨ කළමණාකරණ	බඳවාගැනීම් පටිපාටියට අනුව නියමිත සුදුසුකම් සහිත පුද්ගලයින් තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කළ යුතුය.

		තනතුරේ වසර 05 ක කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු බැවින් අභ්‍යන්තර උසස්වීමක් ලබා දීමට ප්‍රමාණවත් සුදුසුකම් ද සම්පූර්ණ කර නොතිබිණි. එවකට සිටි සභාපතිතුමාගේ සහ අධ්‍යක්ෂක මණ්ඩලයේ උපදෙස් හා අනුමැතියෙන් තොරතුරු තාක්ෂණ කළමණාකාර තනතුර ලබා දී ඇත.	
(උ)	අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවූ සභාපති කාර්යාලයේ ලේකම් තනතුර සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියක් ලබා ගැනීමෙන් තොරව 2024 මාර්තු 25 දින නිලධාරිනියක බඳවාගෙන 2025 නොවැම්බර් 07 දිනවන විට එකතුව රු.1,291,250 ක් වැටුප් ලෙස ගෙවා තිබුණි.	2023.11.24 වන දින පවත්වන ලද අධ්‍යක්ෂක මණ්ඩලයේ බහුතර අනුමැතිය ඇතිව මෙම තනතුර සභාපති කාර්යාලය සඳහා අවශ්‍ය තනතුරක් ලෙස බඳවා ගැනිමට කටයුතු කර ඇතත් ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයේ නොමැති තනතුරක් බැවින් නියමිත බඳවා ගැනිම් කාර්ය පරිපාටිය සිදු කිරීමට නොහැකි විය. මෙම තනතුර සඳහා අදාල රු. 75,000 ක මාසික වැටුප අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියෙන් ලබා දී ඇත.	අදාළ ආයතනවල අනුමැතිය ලබාගැනීමෙන් පසු බඳවා ගැනිමට කටයුතු කළ යුතුය.
(ඌ)	බඳවාගැනීමේ පටිපාටිය අනුව කළමනාකරණ සහකාර තාක්ෂණ - සේවා ගණයට බඳවාගැනීමේ සුදුසුකම්වල (ආ) යටතේ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස්පෙළ) විභාගයේ දී සියලුම විෂයයන් සමත්ව තිබිය යුතු බව පැහැදිලිව දක්වා තිබුණ ද කළමනාකරණ සහකාර (තාක්ෂණික)- සැලසුම් ශිල්පි තනතුර සඳහා සමාලෝචිත වර්ෂයේ දී බඳවාගෙන තිබූ නිලධාරීනිය 2020 වර්ෂයේ ගණිත අංශයෙන් උසස් පෙළ සඳහා පෙනී සිට විෂයයන් 03 න් එක් විෂයයක් පමණක් සමත් වී තිබුණි.	මෙම තනතුර සඳහා බඳවා ගත් අය බඳවාගැනීම් කාර්ය පරිපාටියට අනුව සුදුසුකම් සපුරා නොතිබුණි. සභාපතිතුමාගේ සහ සාමාන්‍යාධිකාරි උපදෙස් පරිදි මෙම බඳවාගැනීම් සිදු කරන ලදි. මෙම කොන්ත්‍රාත් පත්වීම් සඳහා මේ වන තෙක් අග්‍රාමාත්‍ය කාර්යාලයේ අනුමැතිය ලැබී නොමැති අතර. අනුමැතිය ලැබීමෙන් පසු කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමේ දී බඳවා ගැනිම් කාර්ය පරිපාටියට අනුව සුදුසුකම් පරීක්ෂා කර බලා අදාල පත්වීම ලබා දීමට කටයුතු කරමි.	බඳවාගැනීම පටිපාටිය අනුව නියමිත සුදුසුකම් සපුරන නිලධාරීන් පමණක් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය.
(එ)	විගණිත දිනය වන 2025 නොවැම්බර් 07 දින වන විට ඉහළ කළමනාකරණ මට්ටමේ තනතුරු 03 කට අදාළව පුරප්පාඩු 02 ක්ද, මධ්‍යම කළමනාකරණ මට්ටමේ තනතුරු 11 කට අදාළව පුරප්පාඩු 09 ක්ද, කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 09 කට අදාළව පුරප්පාඩු 08 ක්ද පැවතුණි. කළමනාකරණ සහකාර තනතුරු 43 කට අදාළව පුරප්පාඩු 16 ක්ද ප්‍රාථමික මට්ටමේ තනතුරු 69 කට අදාළව පුරප්පාඩු 33 ක්ද පවතින බැවින් පදනමේ එදිනෙදා ව්‍යාපාරික	මෙම පුරප්පාඩු තනතුරු සඳහා බඳවාගැනීම් සිදු කිරීමට අනුමැතිය සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලයට යොමුකර ඇති අතර අනුමැතිය ලැබීමෙන් පසු බඳවා ගැනිම් කාර්ය පරිපාටියට අනුව සුදුසුකම් පරීක්ෂා කර බලා අදාළ පුරප්පාඩු පිරවීමට කටයුතු කරමි.	බඳවාගැනීම් පටිපාටිය අනුව නියමිත සුදුසුකම් සහිත පුද්ගලයන් කඩිනමින් බඳවාගෙන පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය.

	හා මෙහෙයුම් කටයුතු සිදුකර පුරප්පාඩු පිරවීමට හෝ සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.		
(ඒ)	මධ්‍යම කළමනාකරණ මට්ටමට අදාළ වැඩහල් කළමනාකාර, යාත්‍රාංගන කළමනාකාර යන තනතුරු සහ කනිෂ්ඨ කළමනාකරණ මට්ටමට අදාළ පරිපාලන නිලධාරි, අලෙවි නිලධාරි, ගිණුම් නිලධාරි, නිෂ්පාදන නිලධාරි, තත්ව පාලන නිලධාරි හා සැපයුම් නිලධාරි යන තනතුරුවලට අදාළව පහළ මට්ටමේ නිලධාරීන් වැඩබලන බවද අලෙවි කළමනාකාර තනතුරට කොන්ත්‍රාත් සේවකයෙකු සිටින බව ද විගණනයට නිරීක්ෂණය විය. මධ්‍යම හා කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු විශාල ප්‍රමාණයක් පුරප්පාඩු වී පැවතීම හා පහළ මට්ටමේ නිලධාරීන් වසර 02 කට වැඩි කාලයක් තිස්සේ වැඩ බැලීම හේතුවෙන් ඔවුන්ගේ නිත්‍ය තනතුරුවල කටයුතු ද සිදුකිරීමට නොහැකි බැවින් එය ආයතනයේ අරමුණු සාක්ෂාත් කරගැනීම සහ කාර්යසාධනය කෙරෙහි අහිතකර බලපෑම් ඇති කරන බව විගණනයේ දී නිරීක්ෂණය විය.	වැඩබලන තනතුරු සියල්ල සඳහා එම ක්ෂේත්‍රයන් පිළිබඳ ඉතා පලපුරුදු නිලධාරීන් පත් කර ඇත. ආයතනයේ මූල්‍ය අස්ථාවරත්වය මත ස්ථිර තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කර වැටුප් ගෙවීමට අපොහොසත් බැවින් දීමනාවක් පමණක් ගෙවා එම තනතුරුවල රාජකාරී කටයුතු ආවරණය කරයි. මෙම තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ට බඳවා ගැනීම් පරිපාටියට අනුව අභ්‍යන්තර සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ස්ථිර තනතුරු ලබා දීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත. එම තනතුරු බඳවා ගැනීමෙන් පසු පුරප්පාඩු වන තනතුරු සඳහා අවශ්‍යතාවය මත බඳවා ගැනීමට කටයුතු කරමි.	බඳවාගැනීම් පටිපාටිය අනුව නියමිත සුදුසුකම් සහිත පුද්ගලයන් කඩිනමින් බඳවාගෙන පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය.